**පදියතලාව ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 20 දින ලේකම්වරයාට යවන ලදී.

### 1.2 මතය
**---------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
**-----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලෙජරයට අනුව බලපත්‍ර ගාස්තු ආදායම රු.225,450 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට රු.332,850 ක් ලෙස ගෙන තිබුණි. ඒ අනුව ආදායම් හා වියදම් ගිණුමෙහි රු.107,400 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ලෙජරයට අනුව කඩකුලී ආදායම රු.824,400 ක් වුවද, එය ආදායම් හා වියදම් ගිණුමේ රු.772,780 ක් ලෙස දැක්වේ. ඒ අනුව ආදායම් හා වියදම් ගිණුමෙහි ලෙජරයට වඩා රු.51,620 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජරයට අනුව වැටුප් හා දීමනා, ප්‍රවාහන සම්බන්ධ අවශ්‍යතා හා වෙනත් සේවා හා විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත සඳහා කරන ලද වියදම් පිළිවෙලින් රු.10,219,657, රු.389,018 හා රු.85,210 ක් වුවද, ඒවා ආදායම් හා වියදම් ගිණුමට ගෙන ඇත්තේ පිළිවෙලින් රු.11,073,564, රු.465,100 හා රු.86,197 ක් ලෙසය. ඒ අනුව එම වියදම්, ආදායම් වියදම් ගිණුමෙහි පිළිවෙලින් රු.853,907, රු.76,082 හා රු.987 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ලෙජරයට අනුව ගමන් වියදම්, සැපයුම් හා උපකරණ, පොලී ගෙවීම හා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා වියදම් පිළිවෙලින් රු.297,645, රු.3,044,681, රු.29,070 හා රු.887,173 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට ගෙන ඇත්තේ පිළිවෙලින් රු.276,293, රු.3,028,868, රු.26,280 හා රු.771,835 ලෙසය. ඒ අනුව ආදායම් හා වියදම් ගිණුමෙන් ගමන් වියදම් රු.21,352 ක්ද, සැපයුම් හා උපකරණ රු.15,813 ක්ද, පොලී ගෙවීම රු.2,790 ක් හා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව රු.115,338 ක්ද වශයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ඉදිරිපත්වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු මුද්දර ගාස්තුව රු.83,035 ක් වුවද,එය රු.117,270 ක් වශයෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඊ) පොදු ගබඩා හා ඕවර්සියර්ගේ ක්ෂේත්‍ර ගබඩා ලෙස වර්ෂ ගණනාවක සිට රු.114,240 ක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණද, ගබඩාවල එම තොගය භෞතිකව නොපැවතුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශවල ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී නව කඩ කාමර කුලියට දීමෙන් ලද අක්මුදල් තැන්පතු වටිනාකම වූ රු.45,000 ශේෂ පත්‍රයේ දක්වා තිබුණේ රු.40,000 ක් වශයෙනි.

(ඌ) තැන්පතු ලේඛණයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ලද පුස්තකාල තැන්පතු වටිනාකම රු.11,375 ක් වුවද, ශේෂ පත්‍රයට ඇතුලත් කර තිබුණේ රු.9,000 ක් වශයෙනි.

**1.3.2 ගෙවිය යුතු ගිණුම්**

පළාත් පාලන සේවයේ වැන්දඹු අනත්දරු අරමුදලට 2010 වර්ෂයේ සිට ගෙවිය යුතු රු.368,232 ක් දායක මුදල ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

නීති, රීති, රෙගුලාසි වලට හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් පහත පරිදි විග්‍රහ කෙරේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ) ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව** | |
| (I) රීති 59 - 66 | ප්‍රදේශය තුල පරීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අයකල යුතු ආයතන හදුනාගෙන ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (II) රීති 65 | ගෙවීම් පැහැර හරින ලද අයගේ නාමලේඛණයක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි |
| (III) රීති 153 | ආදායම් හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශයක්, පී.එස්.07 ආකෘති පත්‍රය ප්‍රකාරව පවත්වා නොතිබුණි. |
| (IV) රීති 180 | මුදල්, ගබඩා හා ආදායම එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියාකරන නිලධාරීන් තිදෙනා විසින් ඇපකර ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| මුදල් රෙගුලාසි 1647 (ඉ) | මෝටර් වාහන ලේඛණයක් නඩත්තු කර නොතිබිණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.55,547 ක් අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.114,770 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.170,317 ක පසුබෑමක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රාහත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය පුතිඵලය පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ.

(අ) පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ගාස්තු ආදායමෙහි සියයට 18 ක අඩුවීමක්ද, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ, වෙනත් ආදායම් හා වෙනත් ආධාර යන ආදායම් මූලාශ්‍රයන්හි සියයට 14 සිට සියයට 520 ක් දක්වා පරසයක වැඩිවීමක්ද පෙන්නුම් කරයි.

(ආ) ප්‍රනරාවර්තන වියදම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේකෂව සමාලේචිත වර්ෂයේදී වැටුප් දීමනා, ගමන් වියදම්, සැපයුම් හා උපකරණ, ප්‍රාග්ධන වත්කම් නඩත්තුව හා අළුත්වැඩියාව යන වියදම්වල සියයට 18 සිට සියයට 153 ක වැඩිවීමක්ද, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත සහ ආධාර මුදල් සහනාධාර යන වියදම්වල සියයට 18 සිට සියයට 100 ක අඩුවීමක්ද පෙන්නුම් කරයි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේනතුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 129 | 63 | - |
| බදු කුලී | 5,135 | 1,314 | 198 |
| බලපත්‍ර ගාස්තු | 458 | 387 | - |
| සේවා සඳහා ගාස්තු | 605 | 710 | - |
| වරෙන්තු ගාස්තු හා දඩ | 34 | 1,228 | 203 |
| වෙනත් ආදායම් | 170 | 365 | 24 |

**2.3.2 වෙළඳ බලපත්‍ර ගාස්තු**

-------------------------

සභාව විසින් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීමට අදාල ආදායම් ගැසට් කර තිබුණද, එයින් පහත සඳහන් කර්මාන්ත වලට අදාලව සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර තිබූ වෙළඳ ස්ථාන වලට සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු වෙළඳ බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි.

I මුද්‍රණාල
II මිරිස් මෝල්
III මිනී පෙට්ටි සාප්පු
IV කළුගල් කැඩීම හා පිපිරීම
V ඉංග්‍රීසි බෙහෙත් අළෙවිකරන ස්ථාන
VI ලොතරැයි අළෙවි කරන ස්ථාන
VII විදුලි උපාංග අළෙවි කරන ස්ථාන
VIII ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථාන

**2.3.3 දැන්වීම් පුවරු ගාස්තු හා කුළුණු ගාස්තු**

------------------------------------------

2014 වර්ෂය සඳහා දැන්වීම් පුවරු ගාස්තු සඳහා අයකර ගැනීම ගැසට් නිවේදනයේ පළ කර තිබුණද, සභාව විසින් කිසිදු දැන්වීම් පුවරුවකට අදාල ගාස්තු අයකර ගැනීමට සහා බල ප්‍රදේශය තුල පවතින දූරකථන කුළුණු වලින් එකක් හැර අනෙකුත් කුළුණු සඳහා ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එබැවින් රු.12,500 ක පමණ ආදායමක් දැන්වීම් පුවරු හා කුළුණු ගාස්තු ආදායම් වශයෙන් සභාවට අහිමිවී ඇත

**2.3.4 මුද්දර ගාස්තු**

--------------------

2014 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.120,665 ක් අයකර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී මහඔය ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරුවී ගොස් ඇති නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.9,710 ක ආපදා ණය ශේෂය අයකර නොතිබුණි.

(ආ) සභාවේ තිබෙන වාහන 13 න් වාහන 12 කම අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ලොරි රථ 23 කින් හා ත්‍රී රෝද රථ 56 කින් අයවිය යුතු එකතුව රු.125,000 ක ආදායම සභාව වෙත අයවීමට තිබුණද, එම මුදල අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඈ) සභාවේ ආදායම් අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇතත්, එම අතුරු ව්‍යවස්ථා අනුමත කර ගැනීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියා මාර්ගයක් ගෙන නොමැති වීම නිසා සභාවට ලැබිය යුතු ආදායම අයකර ගැනීමට හැකියාවක් නොමැතිව පවතී.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

ප්‍රාදේශීය සභාව සතු වාහන 05 ක් අළුත්වැඩියාව සඳහා ගරාජවලට ඇතුලත් කර වසර 02 කට වඩා අධික කාලයක් තිස්සේ අදාල ස්ථාන වල දිරාපත් වෙමින් පවතින නමුත්, සභාව විසින් නැවත ඒවා ලබාගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.3 නිශ්ක්‍රීය වත්කම්**

---------------

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පිළිසරු ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 4.1 කට ආසන්න මුදලක් වැය කරමින් ඉදිකරන ලද කසළ කළමණාකරන ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයා නොමැති වීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට විගණන දින වන 2015 ජූනි 23 දක්වා එම ගොඩනැගිල්ල නිශ්ක්‍රීයව පැවතුණි**.**

4. **පද්ධති හා පාලනය**

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය